නැණ සයුර අධ්‍යාපනික වැඩසටහන

උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සාධන මට්ටම අනාවරණය කර ගැනීමේ පරීක්ෂණය

2021 අධ්‍යයන වර්ෂය ( 2022)

6 ශ්‍රේණිය | විෂයය :- ගණිතය | කාලය :- පැය 2

# I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පළමු කොටසේ සෑම නිවැරදි පිළිතුරකට ම ලකුණු 02 බැගින් හිමි වේ.**

01. දී ඇති වෘත්ත රටාව නිර්මාණය කිරීම සඳහා යොදා ගෙන ඇති වෘත්ත සංඛ්‍යාව සඳහන් කරන්න.



වෘත්ත සංඛ්‍යාව 05 ——— 2

02. 748 145 001 යන සංඛ්‍යාව වචනයෙන් ලියන්න.

හත්සිය හතළිස් අට මිලියන එකසිය හතළිස් පන්දහස් එක ——— 2

03. 86 342 සංඛ්‍යාවේ 6 න් නිරූපණය වන අගය කීයද?

6, 000 ——— 2

04. පාසල අවසාන වන මෙම වේලාව සම්මත ආකාරයෙන් දක්වන්න.




13 : 30 ——— 2

05. 2 සහ (-1) අතර ඇති නිඛිල සියල්ල ලියා දක්වන්න.

0, 1 ——— 2

06. ශෂික ළඟ ඇති මුද්දර ගණන ආසන්න 10 ට වැටයූ විට 40 කි . ඔහු ළඟ තිබිය හැකි උපරිම මුද්දර ප්‍රමාණය කොපමණද?

44 ——— 2

07. පහත දී ඇත්තේ වාහනයක වේගමානයකි. එහි වේගය පැයට කිලෝමීටර 60 වන විට කටුව කරකැවෙන ප්‍රමාණය දක්වන කෝණය කුමන වර්ගයකට අයත් වේද?




සෘජු කෝණය ——— 2

08. සඳුදා දිනයක පාසලට පැමිණි මුළු ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගණන 525 කි. එදින පාසලට පැමිණි ශිෂ්‍යයන් ගණන 278 ක් නම් පාසලට පැමිණි ශිෂ්‍යාවන් ගණන කොපමණද?

$525 - 278 = 247$

(1) (1)

09. $1035ml$, ලීටර සහ මිලි ලීටර වලින් දක්වන්න.

$1\,l$ $35ml$ (2)

10. හිස් කොටුවට අදාළ සංඛ්‍යාව ලියන්න.

$\frac{7}{12} + \frac{4}{12} = \frac{11}{12}$ (2)

11.

7, 5, 10, 14, 15, 20, 21

i. ඉහත සංඛ්‍යා පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කර රවුම් තුළ ලියා දක්වන්න.

ii. එම කාණ්ඩ දෙක සඳහා සුදුසු නම් දෙකක් තිත් ඉරි මත ලියන්න.

7, 14, 21

15, 5, 10, 20

(1)

7 ගුණාකාර ..................................

5 ගුණාකාර ..................................

(1)

පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩවලට වෙන් කර සුදුසු නම් දෙක සඳහන් කර ඇත්නම් ලකුණු දෙන්න

12. කමල්ට නව වසරේ පාසල් යාම සඳහා පියා විසින් අභ්‍යාස පොත් පාර්සලයක් තෑගි ලෙස දෙන ලදි. එම පාර්සලයේ ඇති පොත් ගණන $x$ වේ. ඉන් පොත් 3ක් කමල් ඔහුගේ මිතුරාට දුන්නේ නම් කමල් ළඟ ඇති ඉතිරි පොත් ගණන සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න.

$x - 3$ (2)

13. සිතුම් තම නිවසේ සිට $50m$ ක දුරක් නැගෙනහිර දිශාවට ගමන් කර කඩයක් අසලට පැමිණියේ ය. අනතුරුව එතැන් සිට $50m$ ක දුරක් උතුරු දිශාවට ගමන් කර පාසලට පැමිණියේ ය. ඒ අනුව සිතුම්ගේ නිවසේ සිට පාසල පිහිටියේ කුමන දිශාවෙන් ද?

ඊශාන දිශාවෙන් (2)

14. කුමාර ළඟ ජම්බු ගෙඩි 15 ක් ද නංගි ළඟ ජම්බු ගෙඩි 12 ක් ද ඇත. කුමාර ළඟ හා නංගි ළඟ ඇති ජම්බු ගෙඩි ගණන අතර අනුපාතය සරල ම ආකාරයෙන් දක්වන්න.

$15 : 12$ (1)

$5 : 4$ (1)

15. $\frac{3}{7}$, $\frac{6}{7}$, $\frac{4}{7}$ දී ඇති භාග සංඛ්‍යා අතුරින් විශාල ම භාගය තෝරන්න.

$\frac{6}{7}$ ———— 2

16.  = 100 ලෙස දක්වා ඇති චිත්‍ර ප්‍රස්තාරයක, පහත පරිදි නිරූපණය වන ප්‍රමාණය කොපමණද?



350 ———— 2

17. රූපයේ දැක්වෙන කොටු ජාලකයේ කුඩා කොටුවක වර්ගඵලය $1\text{cm} \times 1\text{cm}$ වේ. අඳුරු කර ඇති රූපයේ වර්ගඵලය සොයන්න.

$7\ \text{cm}^2$ හෝ වර්ග සෙන්ටිමීටර 7 ———— 2



18. $2^6$ විහිදුවා ලියා අගය සොයන්න.

$2 \times 2 \times 2 \times 2 \times 2 \times 2$ ———— 1

64 ———— 1

19. සෑම මුහුණතක් ම ත්‍රිකෝණාකාර හැඩැති, මුහුණත් 4ක් පමණක් ඇති සන වස්තුවේ නම කුමක්ද?

සවිධි චතුස්තලය ———— 2

20. දී ඇති රූපයේ ලක්ෂණ දෙකක් ලියන්න.



සම්මුඛ පාද දිගින් සමාන වේ

එක් එක් සම්මුඛ පාද යුගලයට අයත් පාද එකම පරතරයකින් පිහිටයි

**ලක්ෂණ එකකට ලකුණු 1 බැගින්**

## II කොටස

- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.**
- **පිළිතුරු සැපයීමේ දී අවශ්‍ය තැන්වල දී පිළිතුරු ලබාගත් ආකාරය දක්වන්න.**

(01) (a) පහත දැක්වෙන්නේ එක්තරා පාසලක 6 ශ්‍රේණියේ සිසුන්ට ගණිත ගුරුතුමිය පාඩමක ක්‍රියාකාරකමක් සඳහා ලබා දෙන ලද කාඩ්පත් කිහිපයකි.

| A | B | C | D | E | F | G | H | I | J |
|---|---|---|---|---|---|---|---|---|---|
| 0.75 | $\frac{2}{3}$ | $\frac{3}{7}$ | $\frac{2}{8}$ | $\frac{4}{8}$ | $\frac{1}{3}$ | $\frac{1}{6}$ | 0.5 | $\frac{5}{7}$ | $\frac{6}{12}$ |

i. ඉහත කාඩ්පත් වල දශම සංඛ්‍යාවලින් දක්වා ඇති කාඩ්පත් හි සඳහන් අගය භාග සංඛ්‍යාවලින් දක්වන්න. (ලකුණු 2)

$0.75 = \frac{75}{100} = \frac{3}{4}$ ——— (1)

$0.5 = \frac{5}{10} = \frac{1}{2}$ ——— (1)

ii. A සහ H කාඩ්පත්වල සඳහන් දශම සංඛ්‍යාවල එකතුව කොපමණ ද ? (ලකුණු 2)

$0.75 + 0.5 = 1.25$ ——— (2)

iii. ඒකක භාග නිරූපණය වන කාඩ්පත්වලට අදාළ අක්ෂර මොනවාද? (ලකුණු2)

F සහ G ——— අක්ෂර දෙකම තිබේ නම් ලකුණු 2

එක් අක්ෂරයක් තිබේ නම් ලකුණු 1

iv. D , E කාඩ්පත්වලින් නිරූපණය වන භාග සංඛ්‍යා < හෝ > ලකුණු යොදා ගනිමින් නිරූපණය කරන්න.

$\frac{2}{8} < \frac{4}{8}$ හෝ $\frac{4}{8} > \frac{2}{8}$ ආකාර දෙකෙන් ඕනෑම පිළිතුරක් සඳහා ලකුණු දෙන්න

(ලකුණු 2)

v. B සහ G කාඩ්පත්වල සඳහන් සංඛ්‍යාවල එකතුව කීයද? (ලකුණු 3)

$\frac{2}{3} + \frac{1}{6}$ ——— (1)

$\frac{4}{6} + \frac{1}{6}$ ——— (1)

$\frac{5}{6}$ ——— (1)

vi. ඉහත I කාඩ්පතෙහි සඳහන් අගයෙන් C කාඩ්පතෙහි අගය අඩු කරන්න. (ලකුණු 1)

$\frac{5}{7} - \frac{3}{7} = \frac{2}{7}$ ——— (1)

vii. H හි සඳහන් භාගයට තුල්‍ය වූ භාග 2 ක් දී ඇති කාඩ්පත් අතරින් තෝරා ලියන්න. (ලකුණු 2)

$\frac{4}{8}$ $\frac{6}{12}$ නිවැරදි පිළිතුරු දෙක සඳහා ලකුණු 2 දෙන්න

නිවැරදි පිළිතුරු එකක් සඳහා ලකුණු 1 දෙන්න

(b) සෙනසුරාදා දිනයක සුපුන්ගේ මව නිවසේ උදෑසන ආහාරය සඳහා රොටි සකසන ලදි.

i. සුපුන් රොටියකින් බාගයක් ආහාරයට ගත්තේ නම් එම ප්‍රමාණය දැක්වෙන රූපයක් අඳින්න (ලකුණු 1)

නිවැරදි රූපය සඳහා ලකුණු 1 දෙන්න



ii. හිස්තැන සම්පූර්ණ කරන්න.

සුපුන්ගේ නැගණිය රොටියක් සමාන කොටස් 3කට බෙදා ඉන් එක් කොටසක් ආහාරයට ගත්තාය. එම කොටස රොටියෙන් .. $\frac{1}{3}$ ……… කි. (ලකුණු 1)



(02) (a) ප්‍රවීන් ඉගෙනුම ලබන පාසලේ ගුරුතුමිය විසින් පන්ති කාමරය අවට පරිසරය නිරීක්ෂණය කිරීමෙන් කෝණ වර්ග හඳුනාගත හැකි අවස්ථාවන් පිළිබඳව දරුවන් සමඟ සාකච්ඡාවක යෙදෙන ලදී.

i. ඔබ ඉගෙනුම ලබන පන්ති කාමරය අවට නිරීක්ෂණය කිරීමෙන් කෝණ දැකගත හැකි අවස්ථාවන් 2 ක් ලියන්න. (ලකුණු 2)

කළු ලෑල්ලේ දාර දෙකක් හමුවන ස්ථානයක්
බිත්ති දෙකක් හමුවන ස්ථානයක්
ගුරුමේසයේ / ළමා මේසයේ දාර දෙකක් හමුවන ස්ථානයක්

වැනි නිවැරදි ව සඳහන් කර ඇති පිළිතුරු 2ක් සඳහා ලකුණු 2 දෙන්න

ii. පහත දැක්වෙන රූපයේ අංක මගින් දක්වා ඇති කෝණ කුමන වර්ගයට අයත් දැයි ලියන්න. (ලකුණු 5)




1…සෘජුකෝණය…
2 සුළු කෝණය
3 පරාවර්ත කෝණය …
4 සුළු කෝණය …..
5 සරල කෝණය …

( නිවැරදි එක් පිළිතුරකට ලකුණු 1 බැගින් )

(b) පාසලක පිහිටි ස්ථාන පිළිබඳ දළ සැලැස්මක් පහත රූපයේ දැක්වේ. ඒ ඇසුරින් පහත දැක්වෙන වගන්තිවල හිස්තැන් පුරවන්න. (ලකුණු 4)




i. ගේට්ටුවට උතුරින් **කාර්යාලය/ ක්‍රීඩා පිට්ටනිය........**පිහිටා ඇත. ( **පිළිතුරු දෙකෙන් එක් පිළිතුරක් සඳහන් කර ඇත්නම් ලකුණු දෙන්න)**

ii. දෙමහල් ගොඩනැගිල්ල බුදු මැදුරට **බස්නාහිර/බටහිර.....** දිශාවෙන් පිහිටා ඇත.

iii. කාර්යාලයේ සිට විද්‍යාගාරය පිහිටා ඇත්තේ **ඊශාන** දිශාවෙනි.

iv. පුස්තකාලයට උතුරින් ඇත්තේ **ළිඳ** ය.

---

(03) (a) පහත දැක්වෙන අවස්ථාවන්හි දී දිග මැනීම සඳහා වඩාත් ම සුදුසු ම මිනුම් උපකරණය වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් තෝරා හිස් තැන මත ලියන්න. ( ලකුණු 03 )

( මිනුම් පටිය, මීටර් කෝදුව, අඩි කෝදුව )

| **අවස්ථාව** | **වඩාත් ම සුදුසු ම මිනුම් උපකරණය** |
|---|---|
| i). ගුරු මේසයේ දිග | **මීටර් කෝදුව** .... |
| ii). ගණිතය පෙළ පොතෙහි පිට කවරයේ පළල | **අඩි කෝදුව** ... |
| iii). ශිෂ්‍යයෙකුගේ ඉණේ වට ප්‍රමාණය | **මිනුම් පටිය** .... |

**( එක් හිස් තැනක පිළිතුරක් සඳහා ලකුණු 1 බැගින් දෙන්න )**

(b) i) පහත දැක්වෙනුයේ ගැමුණු මහා විද්‍යාලයේ නිවාසන්තර ක්‍රීඩා තරඟයක දී වයස අවුරුදු 14 න් පහළ දුර පැනීමේ තරගයට සහභාගී වූ ක්‍රීඩකයින් විසින් පනින ලද දුර ප්‍රමාණයන් වේ. එම දුර ප්‍රමාණයන් අනුව පහත දී ඇති ඒකක පරිවර්තනයන් හි හිස්තැන් සම්පූර්ණ කරන්න. ( ලකුණු 03)

a) දුමිඳු 1m 75cm = 175 cm

b) හසිඳු 156cm = 1 m 56 cm

c) හරිඳු 1.8m = 180 cm

**( එක් හිස් තැනක පිළිතුරක් සඳහා ලකුණු 1 බැගින් දෙන්න )**

ii) වැඩිම දුරක් පැන ඇති ක්‍රීඩකයා කවුද ? හරිඳු ——— 1 (ලකුණු 01)

(c) පහත දැක්වෙන්නේ රුවිනි පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීම සඳහා සකස් කරන ලද සමපාද ත්‍රිකෝණාකාර බිත්ති සැරසිල්ලකි. එම බිත්ති සැරසිල්ල වටා වර්ණවත් රිබන් පටියක් ඇල්ලීමට ඇය අදහස් කරයි නම් ඒ සඳහා අවශ්‍ය රිබන් පටියේ අවම දිග කොපමණද? (ලකුණු 02)



48cm 8mm

48cm 8mm + 48cm 8mm + 48cm 8mm ——— 1

= 146cm 4mm ——— 1

(d) දී ඇති සෘජුකෝණාස්‍රයේ දිග හා පළල මැන ලියන්න. (ලකුණු 02)




නිවැරදි මිනුම් සඳහා ලකුණු 1 බැගින් දෙන්න

---

(04) පාසලක 6 ශ්‍රේණියේ ගණිත ගුරුතුමිය ක්‍රියාකාරකමක් සඳහා පංතියේ සිසුන් වෙත ලබාදෙන ලද කාඩ් පත් කිහිපයක් පහත දැක්වේ.

| 456 | 125 | 013 | 36 | 15 | 6 | 100 | 2 856 312 |
|---|---|---|---|---|---|---|---|
| A | B | C | D | E | F | G | H |

i. a) ඉහත $A, B, C$ කාඩ්පත් පිළිවෙලින් පෙළ ගැසූ විට ලැබෙන සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න. (ලකුණු 02)

456 125 013 ——— 2

b) එය කියවන ආකාරයෙන් ලියන්න. (ලකුණු 02)

හාරසිය පණස් හය මිලියන එකසිය විසිපන් දහස් දහතුන ——— 2

ii. ඉහත කාඩ්පත් අතුරෙන් සමචතුරස්‍ර සංඛ්‍යාවක් තෝරා ලියන්න. (ලකුණු 01)

36 හෝ 100 - එක් සංඛ්‍යාවක් සඳහා ලකුණු 1 දෙන්න

iii. ඉහත දී ඇති $E$ හා $F$ කාඩ්පත්වල සඳහන් සංඛ්‍යාව එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව කීවෙනි ත්‍රිකෝණ සංඛ්‍යාව ද? (ලකුණු 02)

15 + 6 = 21 ——— 1

හයවෙනි ත්‍රිකෝණ සංඛ්‍යාව ——— 1

iv ඉහත i සඳහා ලැබෙන පිළිතුරෙන් H කාඩ්පතෙහි සඳහන් සංඛ්‍යාව අඩුකළ විට ලැබෙන පිළිතුර කීයද? (ලකුණු 02)

456 125 013 – 2 856 312 = 453 268 701 ——— 2

v. $D$ සහ $G$ කාඩ්පත් වල සඳහන් සංඛ්‍යාවල ගුණිතය ලියන්න. (ලකුණු 02)

36 × 100 ——— 1

3600 ——— 1

(05) a) 6 ශ්‍රේණියේ ශිෂ්‍යයෙකු වන කවිඳු ඝන වස්තු පාඩමේ ක්‍රියාකාරකමක් සඳහා සකස් කළ ඇලවුම් වාසි සහිත පතරම රූපයේ දැක්වේ.



i මෙම පතරම භාවිතා කර සාදාගත හැකි ඝන වස්තුවේ නම ලියන්න. ඝනකය ——— 1 (ලකුණු 01)

ii. ඉහත දක්වා ඇති ආකාරයේ පතරම් දෙකක් යොදාගෙන සමාන ඝන වස්තු දෙකක් රවිඳු හා දිනුක සාදන ලදී. ඔවුන් විසින් සාදන ලද එම ඝන වස්තු දෙකේ මුහුණත් දෙකක් එකට සිටින සේ අලවා සංයුක්ත ඝන වස්තුවක් සාදන ලෙසට ගුරුතුමිය උපදෙස් දුන්නාය.

a. සාදන ලද සංයුක්ත ඝන වස්තුවේ නම කුමක්ද? ඝනකාභය ——— 1 (ලකුණු 01)

b. එහි මුහුණත් ගණන ලියන්න. (ලකුණු 01)

06 ——— 1

b) සීවලී මහා විද්‍යාලයේ පවත්වන ලද ගණිත කඳවුරක තේ පැන් සංග්‍රහය සඳහා කමල්ගේ පියා හා නිලූෂිගේ පියා පහත සඳහන් දේවල් ගෙන එන ලදී.

| **ගෙන එන ලද ද්‍රව්‍ය** | **කමල්ගේ පියා** | **නිලූෂිගේ පියා** |
|---|---|---|
| බටර් කේක් | 2kg 750g | 3kg 500g |
| කෙසෙල් ගෙඩි | 5kg 250g | 4kg 680g |
| සීනි | 1kg 500g | 2kg 750g |
| කිරිපිටි | 1kg 400g | 2kg 800g |

i කමල්ගේ පියා හා නිලූෂිගේ පියා විසින් ගෙන එන ලද ද්‍රව්‍යයන්ගේ මුළු ස්කන්ධය සොයා පහත හිස්තැන් සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

| ගෙන එන ලද ද්‍රව්‍ය | මුළු ස්කන්ධය |
|---|---|
| බටර් කේක් | 6kg 250g |
| කෙසෙල් ගෙඩි | 9kg 930g ....................... |
| සීනි | 4kg 250g |
| කිරිපිටි | 4kg 200g ........................ |

ii. පහත දී ඇති වගුවේ සඳහන් පරිදි සාදයේ දී ආහාරයට ගෙන තිබුණේ නම් ඉතිරි ප්‍රමාණයන් සොයා හිස්තැන් සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

| ද්‍රව්‍ය | ආහාරයට ගත් ප්‍රමාණය | ඉතිරි ප්‍රමාණය |
|---|---|---|
| බටර් කේක් | 5kg 750g | 500g............................... |
| කෙසෙල් ගෙඩි | 7kg 500g | 2kg 430g............................... |
| සීනි | 3kg 500g | 750g |
| කිරිපිටි | 3kg | 1kg 200g |

(06) a) වෙළඳ සැළක එක් මාසයක දින 30 ක් තුළ දී අලෙවිකරණ ලද මුව ආවරණ සංඛ්‍යාව පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

10, 15, 10, 20, 25, 15, 20, 15, 30, 20

15, 10, 15, 20, 20, 25, 20, 30, 15, 20

10, 15, 15, 25, 20, 10, 20, 25, 20, 10

i. ඉහත දී ඇති තොරතුරු ඇසුරෙන් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

| අලෙවි කළ මුව ආවරණ ගණන | ප්‍රගණන ලකුණු | දින ගණන |
|---|---|---|
| 10 | //// / | 6.... |
| 15 | //// /// ........ | 8...... |
| 20 | //// //// ...... | 10 |
| 25 | //// | 4 |
| 30 | // | 2 |

( එක් හිස් තැනක නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් දෙන්න )

ii. අඩුම දින ගණනක දී අලෙවි කළ මුව ආවරණ සංඛ්‍යාව කොපමණද? 30 (ලකුණු 01)

b) උප තැපැල් කාර්යාලයක් සතියේ දින 5 තුළ අලෙවි කරන ලද මුද්දර සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ.

| දවස | ප්‍රමාණය |
|---|---|
| සඳුදා | 25 |
| අඟහරුවාදා | 20 |
| බදාදා | 40 |
| බ්‍රහස්පතින්දා | 25 |
| සිකුරාදා | 15 |

ඉහත වගුවේ සඳහන් දත්ත චිත්‍ර ප්‍රස්තාරයකින් පහත පරිදි නිරූපණය කර ඇත.

| දවස | මුද්දර ගණන |
|---|---|
| සඳුදා |  |
| අඟහරුවාදා |  |
| බදාදා |  |
| බ්‍රහස්පතින්දා |  |
| සිකුරාදා |  |

 = මුද්දර 10 ක් නිරූපණය වේ.

i. බදාදා සහ බ්‍රහස්පතින්දා දින අලෙවි කළ මුද්දර සංඛ්‍යාව චිත්‍ර ප්‍රස්තාරය තුළ නිරූපණය කරන්න.
එක් එක් දිනය සඳහා නිවැරදි රූපයට ලකුණු 2 බැගින් දෙන්න
(ලකුණු 04)

ii. වැඩිම මුද්දර සංඛ්‍යාවක් අලෙවි කර ඇත්තේ කවදාද? එම ප්‍රමාණය කොපමණද? (ලකුණු 01)

බදාදා
40
(1)

iii. සමාන මුද්දර සංඛ්‍යාවක් අලෙවි කළ සතියේ දවස් මොනවාද? (ලකුණු 01)

සඳුදා
බ්‍රහස්පතින්දා
(1)